මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

හා

අභ්‍යාස ආයතනය

වාර්ෂික වාර්තාව

2015

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස
ආයතනය
“ඩිල්කෝ කෝට්” ගොඩනැගිල්ල
නව නුවර පාර,
මාලබේ.
2015.12.29

ලේකම්තුමා
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
සම්පත්පාය,
අංක 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි

වාර්ෂික වාර්තාව 2015

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2015 වර්ෂය සඳහා වූ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තා
2. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආයතනයේ ආදායම් හා වියදම් වාර්තාව, 2015 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය
3. 2015 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව

මෙයය විශ්වාසී

නවරත්න බණ්ඩාර අලහකෝන්
සභාපති

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

දැක්ම

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම"

මෙහෙවර

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පීය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි "

අභිමතාර්ථ

" ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණාය කර තිරසාර ලෙස නෙලා ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම"

2. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2.2 2015 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

01	නවරත්න බණ්ඩාර අලහකෝන් මහතා (සභාපති)	2015/01/22 දින සිට අද දක්වා අධ්‍යෂක් මණ්ඩල සභාපති
02	ආචාර්ය වි.එම්.ඩී.එම්.කේ.දිසානායක මහතා	2015/02/20 දින සිට 2017/06/05 දින දක්වා අධ්‍යක්ෂක මණ්ඩල සමාජික (භූ විද්‍යා පතල් කාර්යංශය - සභාපති)
03	එච්.කේ.ජී.කේ. නැම්මවත්ත මහතා	2015/02/20 දින සිට 2017/05/21 දින දක්වා අධ්‍යක්ෂක මණ්ඩල සමාජික (මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - අධ්‍යක්ෂක ජනරාල්)
04	කේ.ඩී.ආර්. ඔල්ගා මිය	2015/03/18 දින සිට අද දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (භාණ්ඩාගාර නියෝජිත)
05	එම්.වී.එන්.එම්. වික්‍රමසිංහ මහතා	2015/06/25 දින සිට 2017/03/30 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - අධ්‍යක්ෂක ජනරාල්)

2.2 ඉහළ කළමණාකාරිත්වය

තිලක් ධර්මරත්න මහතා - ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
(B.Sc, M.Sc in Gemmology (SL), M.Sc (UK)

3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමා ගේ සමාලෝචනය

3.1 අවස්ථා

- **පර්යේෂණ සහ පුහුණු සඳහා ඉල්ලුම වැඩි කිරීම.**

  ආයතනයේ සේවාවන් සඳහා දේශීය හා විදේශීය ඉල්ලුම් වර්ධනය වෙමින් තිබේ. මෙම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා හොඳ ඉල්ලුමක් පැවතීම මෙම ඉල්ලුම වර්ධනය කිරීමට හේතු වී ඇත. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවාවන් වල ගුණාත්මක තත්වය ඉහල නැංවීමට ගත් ක්‍රියාමාර්ග හරහාද මෙම සේවාවන් වල ඉල්ලුම වැඩි වීමට හේතු වී ඇත. මෙම ක්ෂේත්‍රයට අදාලව සම්පූර්ණ පරාසය තුල පුහුණු සේවාවන් ලබා දෙන වෙනත් කිසිදු ආයතනයක් නොමැත. එසේම මෙම කර්මාන්තයට අවශ්‍ය පර්යේෂණ අවශ්‍යතා සපුරාගෙන සේවා සපයන්නෙකු ද කලාපය තුල නොමැත. එසේම දැනට සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගනිමින් තිබෙන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල පුහුණු වෙළඳපොළ අවශ්‍යතාවයන් සැපිරීමද සිදුකිරීමේ අවකාශය ඇත.

- **සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා**

  ක්ෂේත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත. මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේශණ, ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම, ප්‍රාථමික මැණික් නිධි ලබා ගැනීමේ තාක්ෂණය සැලසුම් කිරීම හා සැකසීම, සහ පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝසතර නිර්මාණ සහ නිෂ්පාදනය වෙනුවෙන් පුහුණුව ලබා දීම වෙනුවෙන්ද ඇතුලත් වේ.

- **තාක්ෂණික අභිවර්ධනය**

  මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත.

- **ආයතනයේ දියුණුව**

  ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභීන් සඳහා සේවය ලබා දීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ විශ්ව විද්‍යාලයක් මට්ටමට මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යතාවය ද ඇත.

- **වෙනත් පහසුකම්**

  ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් මගින්ද මෙම ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අසමසම මට්ටමක ආයතනය පවතී.

- **කර්මාන්තයේ දියුණුව සඳහා සංඝීය වැඩසටහන්**

  පරිසර අධිකාරීන් සමග මැණික් කර්මාන්තය සඳහා පරිසර හිතකාමී ක්‍රම සඳහා අනුබල දීමද, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පර්යේෂණ ව්‍යාපෘති සඳහා ද, වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහාද සහ සම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත.

- **ප්‍රචාරක වැඩසටහන්**

  ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම කල යුතුව ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, මැණික් හා ස්වර්ණාභරණ සඟරා සහ පුවත් පත්‍රිකා, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය යොදා ගත හැක.

3.2 අභියෝග

- **යටිතල පහසුකම්**

  පුහුණු ඒකක වල ප්‍රමාණවත්ව නවීන පහසුකම් හා යන්ත්‍ර උපකරණ සංවර්ධනය වී නොමැත. එවැනි උපකරණ මෙම පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට අවශ්‍ය පුහුණුවල දැනුම හා කුසලතාවය ලබා දීමට කඩිනම් පියවර ගත යුතු වේ. ස්වර්ණාභරණ පුහුණු ඒකක වල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍ර උපකරණ හඳුන්වා දිය යුතු වේ. තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත. දියමන්ති කැපීම මෙම කර්මාන්තයේ සුවිශේෂී කර්මාන්තයක් වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබා දීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා පියවර ගත යුතුවේ.

- **භෞතික සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන හා උපකරණ වල හිඟකමක් දක්නට ඇත. තවද වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි පර්යේෂණාගාර පහසුකම්ද වැඩි දියුණු කිරීමට අවශ්‍යව ඇත.

- **සේවකයන්ගේ දුරුවල ආකල්ප**

  මෑත අතීතයේ සේවකයින් තුල සෘණාත්මක ආකල්පමය මානසික පසු බිමක සිටීම.

- **සහෝදර ආයතන මඟින් අපගේ සේවාවන්ම සිදු කිරීම.**

  උදාහරණ:- අපගේ පුහුණු, රසායනාගාර සේවා ආදිය.

- **මානව සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිත වීම නිසා සහ මෙම ක්ෂේත්‍ර යේ විෂය දැනුම සහිතව සිටින නිළධාරීන් සීමිත වීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීමට ඇති අවස්ථාවන් අවම වීම නිසා අප කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුම සැපරීමට ප්‍රමාණවත් නොවන බව පෙනීයයි. එය කර්මාන්තයේ අනාගතයට හිතකර නොවන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම පහලයාමට බලපෑ හැකිය. ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා හැකිතාත් දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමෙන් මෙම තත්වය සඳහා විසඳුම් ලබා ගත හැකි වේ.

- **මූල්‍ය සම්පත්**

  වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරනාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් දායකත්වයක් මහාභාණ්ඩාගාරය වෙතින් ලැබේ.

- **පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම**

  මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍ර යේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

- **කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම**

  උදාහරණ- සේවා කැපුම් අංශය

4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

4.1 අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පාර්ලිමේන්තු පනතේ 25 (1) වගන්ති ප්‍රකාරව 1995 ජුලි 28 දිනැති හා අංක 882 ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ හා පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබිය. ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරිම වැඩි දියුණු කිරිම හා සංවර්ධනය කිරිමයි.

4.2 ආයතනයේ බලතල

1995 ජුලි 28 දිනැති අංක 882 දරණ ගැසට් පත්‍රය මගින් ආයතනයට පවරා ඇති බලතල පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ හා එම නිධි පිලිබඳව සමීක්ෂණය කිරිම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
   i. එවායේ පිහිටිම
   ii. හඳුනා ගැනීම
   iii. මැණික් ගල් අනර්ගීකරණය කරන ක්‍රම
   iv. ආයතනයට සම්බන්ධ වෙනත් ක්ෂේත්‍ර වල කටයුතු

(ii) පතල් කැපීම් ,මැණික් කැපීම, ස්වර්ණාභරණ නිෂ්පාදනය සහ මැණික් පිරියම් ක්‍රම යන අංශ වලට අදාලව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සංවර්ධනය සඳහා යන්ත්‍ර සුත්‍ර නිපදවීම ඇතුලු තාක්ෂණික හා අනෙකුත් උපදෙස් ලබාදීම.

(iii) පහත සඳහන් පුහුණුව ලබාදීම
   i. මැණික් කැපීම
   ii. ස්වර්ණාභරණ නිෂ්පාදනය
   iii. දියමන්ති ඇතුළු රත්න විද්‍යාව
   iv. ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය
   v. මැණික් ගල් අනර්ගීකරණය හා ගෙවුඩ තාපකරණය ඇතුළුව
   vi. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත වලට සම්බන්ධ අනෙකුත් අංශ

4.3 ක්‍රියාකාරකම් හා කාර්යක්ෂමතාවය

4.3.1 පුහුණු පාඨමාලා දිවයිනේ ප්‍රචලිත කිරීම සඳහා පියවර ගෙන තිබු අතර තරුණ තරුණියන් අඛණ්ඩව පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත.

01. පුහුණු පාඨමාලාවන්

මෙම වර්ෂයේදී පාඨමාලාවන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචියේ සිදු කර ගනු ලැබූ වර්ධනය පවත්වාගෙන යාමට හැකි වී තිබුනි. පසුගිය වසරට සාපේක්ෂව 2015 තුළ ශිෂ්‍ය ලියාපදිංචියේ වර්ධනය 13% වූ ඒ අනුව පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව 674 ක් ලෙස වාර්තා වේ.

පාඨමාලාව	සිසුන් සංඛ්‍යාව
රත්න විද්‍යාව	**134**
ගෙවුඩ තාප පිරියම්කරණය	**96**
මැණික් කැපීම හා ඔප දැමීම	**190**
මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය	**157**
ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	**37**
ස්වර්ණාභරණ නිෂ්පාදනය	**42**
විලාසිතා ආභරණ නිෂ්පාදනය	**18**
එකතුව	**674**



2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය කාර්යසාධනය

පාඨමාලාව	ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව				
	2011	**2012**	**2013**	**2014**	**2015**
රත්න විද්‍යාව	36	103	38	120	134
ගෙවුඩ තාප පිරියම්කරණය	38	51	105	86	96
මැණික් කැපීම හා ඔප දැමීම	108	83	81	122	190
මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය	57	89	142	195	157
ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	31	34	46	27	37
ස්වර්ණාභරණ නිෂ්පාදනය	58	39	46	49	42
විලාසිතා ආභරණ නිෂ්පාදනය	-	24	-		18
ආභරණසඳහා ගල් බැදීම	-	9	-		
එකතුව	**328**	**432**	**458**	**599**	**674**



02. **පාඨමාලා සඳහා අදාළ වන වෙනත් සංවර්ධන වැඩසටහන්**

- මොරගහකන්ද, ඇළහැර, බකමූණ වැනි මැණික් ලැබෙන ප්‍රදේශයන් ආවරණය වන පරිදි නව මැණික් හා ස්වර්ණාභරණ පුහුණු මධ්‍යස්ථානයක් ගුරුවෙල ස්ථාපිත කර මැණික් කැපීම හා ඔප දැමීම පාඨමාලාව ආරම්භ කරන ලදි. මෙම පාඨමාලා හදාරන ලද පුහුණුලාභීන් රත්නපුර ඇති කර්මාන්ත ශාලාවන්ට අනුයුක්ත කරන අතර යම් සංඛ්‍යාවක් ස්වයංරැකියාවක් ලෙස හා මැණික් කර්මාන්තයේ අනෙකුත් නිෂ්පාදන අංශ සඳහා සහය පිණිස යොමු විය.

- මැණික් හා ස්වර්ණාභරණ කර්මානතයේ නූතන කර්මාන්ත හා ශිල්පීය යෙදීම් සම්බන්ධ අපගේ පුහුණු උපදේශකයින් යාවත්කාලීන කිරීම සඳහා වැඩමුළු 02ක් පවත්වන ලදි. මේ වනවිටත් උපදේශකයින් සිසුන්ගේ දැනුම වර්ධනයට ඉගැන්වීමේ දී යොදාගනී.
  - ✓ 2015.12.28 දින මාලබේ ප්‍රධාන කාර්යාලයේදී පුහුණු උපදේශකවරුන් සඳහා පැවැත්වූ ස්වර්ණාභරණ නිෂ්පාදනය තාක්ෂණික වැඩමුළුව.
  - ✓ 2015.12.22 දින මාලබේ ප්‍රධාන කාර්යාලයේදී පුහුණු උපදේශකවරුන් සඳහා පැවැත්වූ මැණික් කැපීම හා ඔප දැමීම තාක්ෂණික වැඩමුළුව.

- ප්‍රාදේශීය වශයෙන් කර්මාන්තය සඳහා යොමු වී ඉහළ දැමීම සඳහා කර්මාන්තයේ ඇති ප්‍රතිලාභ හා අවකාශය සම්බන්ධ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සූරියවැව, නිවිතිගල, රත්නපුර හා ගම්පහ යන ප්‍රදේශයන්හීදි පවත්වන ලදි. මේ හරහා දැනුවත්ව සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් පාඨමාලා සඳහා යොමු වීම මේ වන විටත් ඔවුන් විවිධ නිෂ්පාදන කාර්යන්හි යෙදී ඇත.

- ආයතනයේ නව පුහුණු පාඨමාලා ඉහළ ගුණාත්මක තත්වයකින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මේ නිසා පාඨමාලා තාක්ෂණික හා ශිල්පීය අංශ වලින් යාවත්කාලීන කිරීමට හා ජාතික හා ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති කිරීමට කටයුතු දියත් කෙරිනි. ඒ අනුව ,
  - ✓ මැණික් මොස්තර තාක්ෂණවේදය පාඨමාලාව ජාතික වෘත්තීය නිපුණතා (NVQ 4) මට්ටමට ප්‍රතිතනය කර ඇත.
  - ✓ ස්වර්ණාභරණ නිෂ්පාදනය පාඨමාලාව ජාතික වෘත්තීය නිපුණතා (NVQ 5) මට්ටමට ප්‍රතීතනය කිරීම සඳහා කටයුතු දියත් කෙරිණි.

4.5 මානව සම්පත් සංවර්ධනය

නම	තනතුර	වැඩමුළුව /පාඨමාලාව	ආයතනය
ධනුෂ්ක රවීන්ද්‍රසිංහ මයා	පර්යේෂණනිලධාරි	Business Proposal Writing	National Science Foundation
ජී.ජී.එම්.එස්.වික්‍රමසිංහ මයා			
සමුද්‍රා විජේවර්ධන මෙනෙවිය			
ඩබ්.ජී.ජේ.සෙනෙවිරත්න මිය	වැඩසටහන්නිලධාරී		
එච්.එල්.එස්.යූ. මදනායක මෙය	කළමණාකරණ සහකාර	Attitudes and skills Development	Institute of Human resource Advancement
පී.කේ.වික්‍රමආරච්චි මෙය			
කේ.ජී.එච්.එස්.ජයසේකර මෙය			
ජේ.පී.කේ.සංදීප් මයා			
එස්.කේ.විතානගේ මෙය			
අසෝක රාජරත්න මයා	කළමණාකරණසහකාර	ගබඩාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ඉදිකිරීම්යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය
එච්.එල්.එල්.ජනිත්‍රි මෙය	කළමණාකරණ සහකාර	Attitudes and skills Development	Institute of Human Resource Advancement
පී.ඒ.කේ.එන්.පෙරේරා මෙය			
එන්.කේ.ආර්.ප්‍රසාදිකා මිය			
එස්.එල්.ජේ.මුහන්දිරම් මයා	සහකාරඅධ්‍යක්ෂ (මූල්‍ය)	Exceptional Leadership & Authentic Image Management	Skill Development Fund Ltd
ජේ.පී.කේ.සංදීප් මයා	කළමණාකරණසහකාර	Practical Aspect of Bid evaluation	Skill Development Fund Ltd
එච්.මාපලගම මයා	පුහුණු නිලධාරී	Training of Training	Skill Development Fund Ltd
ඒ.එස්. සමරවීර මයා			
නදීෂා නිවන්ති මිය	කළමණාකරණසහකාර	Event Management	Skill Development Fund Ltd

පර්යේෂණ ව්‍යාපෘති ප්‍රගතිය

01) .ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය

ලෝකයේ මැණික් සම්පත බහුල රටවල් පහ අතුරින් එකක් වන ශ්‍රී ලංකාවේ භූමියෙන් 90% ක් පමණම මැණික් විභවයන් සහිත බව තක්සේරු කර ඇත. නමුත් ස්වභාවික පරිසරයට අවම හානියක් වන පරිදි ඒවා කැණීම් සිදු කිරීම වර්තමානයේ කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වේ.

මෙයට පිළියමක් ලෙස මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය මගින් තිරසාර උපයෝජනයක් වෙනුවෙන් මැණික් නිධි හඳුනාගැනීමට, විභවය ඇගයීමට සහ ලැයිස්තුගත කිරීමට ශ්‍රී ලංකාවේ ක්‍රමවත් මැණික් නිධි ගවේෂණ වැඩසටහනක් යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාව පුරා මැණික් විභව සිතියම් නිර්මාණය කිරීම මගින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියැලී සිටින කොටස් කරුවන්ගේ දියුණුව සැලසීම හරහා රටේ තිරසාර සංවර්ධනයයි. 2008 වර්ෂයේදී මේ සඳහා විස්තරාත්මක යෝජනාවක් කැබිනට් මණ්ඩලය වෙත ලබාදුන් අතර ඒ සඳහා අවශ්‍ය අරමුදල් හා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ (රූප සටහන 01) ක්‍රියාත්මකව පවතී.

2015 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම, බිබිල, සියඹලාණ්ඩුව, බඩල්කුඹුර හා මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලද ක්‍රියාත්මකව පැවති අතර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති කටයුතු අවසන් කර අවසන් සිතියමද මේ වන විට ප්‍රකාශයට පත් කර ඇත.(රූප සටහන 02). 2015 වර්ෂය අවසාන වන විට මැදගම, බිබිල, සියඹලාණ්ඩුව හා මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලද ව්‍යාපෘති කටයුතු අවසන් වෙමින් මූලික මැණික් විභව සිතියම හා ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු බොහොමයක් අවසන් කර ඇත. (රූප සටහන 03) සියඹලාණ්ඩුව හා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සැලකිය යුතු මට්ටමේ මැණික් විභවතාවයක් නොමැති බව නිරීක්ෂණය කෙරිණි.



රූප සටහන 01: අධ්‍යයන ප්‍රදේශය

රූප සටහන 02- a. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු



රූප සටහන 02- b. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවසන් සිතියම

රූප සටහන 03.- a : මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු



රූප සටහන 03-b මඩුල්ල ප්‍රා. ලේ. කොට්ඨාශයේ ව්‍යුහය හා ක්ෂේත්‍ර ගවේෂණ ස්ථාන



රූප සටහන 03- C : මැදගම ප්‍රා. ලේ. කොට්ඨාශයේ ප්‍රාථමික මැණික් විභව සිතියම

රූප සටහන 03- d: මැදගම ප්‍රා. ලේ. කොට්ඨාශයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු



රූප සටහන 03- f: සියඹලාණ්ඩුව ප්‍රා. ලේ කොට්ඨාශයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු

රූප සටහන 03- e : සියඹලාණ්ඩුව ප්‍රා. ලේ කොට්ඨාශයේ අධ්‍යයන ප්‍රදේශය



රූප සටහන 03-g: බිබිල ප්‍රා. ලේ කොට්ඨාශයේ මැණික් විභවතාව

රූප සටහන 03-h : බිබිල ප්‍රා. ලේ කොට්ඨාශයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු

02). තිරසාර සංවර්ධනයක් සඳහා පරිසර හිතකාමී මැණික් පතල් කැණීමේ ක්‍රම හඳුන්වා දීමේ ව්‍යාපෘතිය

මැණික් පතල් කැණීම හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවික පරිසර තත්වයන් තර්ජනයට ලක්වී ඇත. මේවා අවම කිරීමටත්, ඊට පිළියම් වශයෙන් නව පරිසර හිතකාමී පතල් කැණීම් ක්‍රමවේදයන් හඳුන්වා දීමත් අප ආයතනය සතු වගකීමකි.

මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් සිදු කරනු ලැබූ අතර, මූලික ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු හා අධ්‍යයනයන් අවසන් කර ඇත (රූප සටහන 04). 2015 වර්ෂයේ අවසන් කාර්තුවේ මධ්‍යම කඳුකර ප්‍රදේශයට බලපෑ අහිතකර කාලගුණ තත්වය හේතුවෙන් ව්‍යාපෘති තටයුතු අවසන් කිරීම කිසියම් පසු බැමකට ලක් විය.

රූප සටහන 04: පර්යේෂණ කණ්ඩායම ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු වල නිරත වීම හා හඳුනාගත් තර්ජනයට ලක් වූ ස්ථාන

03) ප්‍රකාශන

2015 වර්ෂයේදී භූ විද්‍යා සංගමයේ 31 වැනි තාක්ෂණික සැසියේදී “Appraisal of Gem Deposits in Badalkumbura Area, Sri Lanka” නමින් පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී. (රූප සටහන : 05)

Proceedings of the 31st Technical Session of Geological Society of Sri Lanka
Published Online - 27th February 2015 (http://www.gsslweb.org)
GSSL-2015-17

Appraisal of Gem Deposits in Badalkumbura Area, Sri Lanka

R.M.R.S. Ratnayake[1,*], S.V.T.D. Raveendrasinghe[2], R.M.N.P.K. Jayasinghe[2], T.S. Dharmaratne[2] and H.M.R. Premasiri[3]

[1]*Department of Geology, University of Peradeniya, Peradeniya, Sri Lanka.*
[2]*Gem and Jewellery Research and Training Institute, Malambe, Sri Lanka.*
[3]*Department of Earth Resources Engineering, University of Moratuwa, Moratuwa, Sri Lanka.*

**e-mail: rupikasandamali@gmail.com*

Badalkumbura divisional secretariat in the Monaragala district of the Uva province, Sri Lanka is one of the major gem occurrences in the south eastern slope of the central highlands. Kumbukkan oya and Menik ganga are the main surface drainages, supported by widely distributed perennial and seasonal network of tributaries. Geologically, the study area belongs to the Highland Complex and it is located close to the boundary of Highland and Vijayan Complexes. The area consists of high grade metamorphic rocks such as calc gneiss, garnet sillimanite graphite gneiss, biotite gneiss, and chanockite gneiss. Both primary and secondary gem deposits can be found in the area. This study focused to evaluate potentiality of gem deposits in the Badalkumbura divisional secretariat.

Field investigations were carried out to identify localized gem fields. Based on textural, structural, mineralogical and geological observations, gem fields were categorized into primary and secondary gem occurrences. Furthermore, exploratory auger sampling was carried out representing each gem field for further laboratory investigations. Selected gem bearing gravel layer was thoroughly washed and sieved. Mineral identification was carried out using gemmological microscope for 125 µm, 250 µm, and 500 µm grain sizes. The extent and distribution of the identified gem fields were demarcated and the gem potential map was prepared using GIS and Remote Sensing techniques.

According to the field observations, primary gem occurrences are commonly associated with impure calc gneiss and garnet sillimanite graphite gneiss. Due to higher weathering susceptible mineralogy of these host rocks tends to form residual gem deposits rich with spinal, garnets etc. These residual deposits contribute to form secondary gem deposits due to the process of transportation and deposition following the local drainage network. Therewith, the geomorphology is a governing factor to form such gem deposits at specific localized points or regions along the stream courses. According to the laboratory studies, 0.3% of yellow sapphire, 0.1% of blue sapphire, 0.5% of geuda (low quality corundum which can be turned into gem quality corundum by heat treatment), 4% of spinal, 2% of garnet, 1% of zircon and tourmaline are the main gem minerals found in these gem fields. Considering the results of both field and laboratory analysis, Badalkumbura divisional secretariat can be recognized as a high gem potential area.

17

රූප සටහන 05: “Appraisal of Gem Deposits in Badalkumbura Area, Sri Lanka” පර්යේෂණ පත්‍රිකාව

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය
පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු

	2011	2012	2013	2014	2015
මෙහෙයුම් ආදායම					
භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන	27,420	29,629	32,113	43,357.0	47,081.0
වෙනත් දායක වීම්	12,500	13,853	13,020	13,862.9	26,447.4
පාඨමාලා ගාස්තු	3,256	5,228	3,949	6,941	6,408.5
සේවා ගාස්තු ආදායම	25	30	15	-	-
භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම්					
මුළු මෙහෙයුම් ආදායම්	**43,201**	**48,740**	**49,097**	**64,161**	**79,936.9**
වෙනත් ආදායම්	44	223	38	303	625.8
පොලී අදායම්	166	309	406	309	248.2
වෙනත් ලැබීම්	205	140	54	-	49.5
මුළු ආදායම	**43,616**	**49,412**	**49,595**	**64,773**	**80,860.4**
අඩුකලා - වියදම්					
ඒ සේවක හා පරිපාලන වියදම්	30,328	35,403	37,260	44,558	57,081.4
බී ක්ෂය සහ පොදු වියදම්	12,905	14,217	13,452	17,572	31,260.6
මුළු වියදම්	**43,233**	**49,619**	**50,712**	**62,130**	**88,342**
අතිරික්තය (ඌණතාවය)	**383**	**(207)**	**(1,117)**	**2,643**	**(7,481.6)**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශ

විස්තරය	2015		2014	
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මෙහෙයුම් ආදායම				
පුනරාවර්තන ප්‍රදාන - භාණ්ඩාගාර		47,081.0		43,357. 0
වෙනත් ආදායම්				
පාඨමාලා ගාස්තු		6,408.5		6,941.2
ගෙවුඩ තාපකරණ ගාස්තු				
භූ විද්‍යා පර්යේෂණ සේවා		-		-
පොලී අදායම්		248.2		309.3
විවිධ ආදායම්		625.8		303.6
මෙහෙයුම් ආදායම් එකතුව		**54,363.5**		**50,911.1**
අඩුකලා - මෙහෙයුම් වියදම්				
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා		31,356.7		23,092.9
ගමන් වියදම්		510.6		279
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය		1,382.8		1,753.3
නඩත්තු වියදම්		4,600.4		2,676.2
ගිවිසුම් ගත සේවා		16,293.6		14,588.1
පුහුණු වියදම්		2,452.8		1,321.1
වෙනත් මෙහෙයුම් වියදම්		458.6		759.7
මෙහෙයුම් වියදම් එකතුව		**57,055.5**		**44,470.3**
මෙහෙයුම් වලින් ලද අතිරික්තය/(ඌනතාවය)		**(2,692)**		**6,440.8**
අඩු කළා - මුල්‍ය පිරිවැය		(25.9)		(88.2)
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන	21,027.0		7,382.5	
වෙනත් ලැබීම්	-			
	21,027.0		7,382.5	
අඩු කළා - ක්ෂය කපා හැරීමේ වියදම්	(25,840.2)	(4,813.20)	(11,092.2)	(3,709.7)
වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන	5,420.4		6,480.4	
අඩු කළා - ප්‍රාග්ධන ආයෝජන වියදම්	(4,800.9)		(5,357.4)	
ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම්	(619.5)		(1,123.0)	
වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම් මෙහෙයුම් නොවන ආදායම්		**(4,839.10)**		**(3,797.8)**
එකතු කළා වත්කම් විකිණීමෙන් ලද ආදායම්		49.5		
අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතාවය)		(7,481.60)		2,642.9
අති විශේෂ අයිතම		-		
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)		(7,481.60)		2,642.9
එකතු කළා				
පෙර වර්ෂය සඳහා ශුද්ධ **අතිරික්තය/ (ඌනතාවය)**	(61,463.97)		(63,955.78)	
අඩු කළා - පෙර වර්ෂ ගැලපීම්		(1,141.1)		(151.1)
ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය)		**(70,086.70)**		**(61,464.0)**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

2015.12.31 දිනට ශේෂ පත්‍රය

	2015		2014	
විස්තරය	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපල යන්ත්‍ර උපකරණ	53,110		69,830	
පාරිතෝෂික අරමුදල	252	53,362	1863	71,693
විලම්භිත වියදම්				
නවීකරණය සහ වෙන් කිරීමේ වියදම්				
ජංගම වත්කම්				
තොග හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය	833		833	
අඩු කළා - ලියා හැරීම් සඳහා වෙන් කිරීමේ	(648)		(648)	
	186		186	
විකිණීම සඳහා ඇති පොත්	24		62	
ණය හා අත්තිකාරම්	1,984		977	
බැංකු තැන්පතු ගිණුම් (කෙටිකාලීන)	3,805		3,610	
තැන්පතු	2,700		2,700	
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්	615		616	
පෙර ගෙවීම්	198		114	
මුදල් හා බැංකු	29,697	39,210	16,295	24,559
වත්කම් එකතුව		92,573		96,253
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවිය යුතු ගිණුම්	358		240	
උපචිත වියදම්	4,083		2,364	
ණය හිමියෝ	119		119	
උපයන විට ගෙවීම් බදු	4		1	
ගෙවිය යුතු වන්දි	231			
ගෙවිය යුතු පාරිතෝෂික ජංගම ගිණුම්	373	5,168	231	2,955
ජංගම නොවන වගකීම්				
පාලන ගිණුම් (ජා.මැ.ස්. අධිකාරිය)	3,179		3,179	
ප්‍රදාන - (වෙනත් ආයතන)	232		232	
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	9,211		9,908	
සේවක ආරක්ෂක තැන්පතු	10	12,632	10	
				13,329
වගකීම් එකතුව		17,801		16,285
ශුද්ධ වත්කම් එකතුව ශුද්ධ		**74,772**		**79,968**
ශුද්ධ වත්කම් / ස්කන්ධ				
සහභාගීත්ව ප්‍රාග්ධනය		50,000		50,000
සංචිත		4,500		4,500
වෙනත් දායක වීමේ		850		850
සේවක චක්‍රීය අරමුදල්		882		834
විලම්භිත ආදායම් රු. ප්‍රාග්ධන ප්‍රතිපාදන		88,626		85,247
සමුච්චිත අරමුදල		(70,087)		(61,464)
ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව		**74,772**		**79,968**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2015	2014
මෙහෙයුම් කාර්යන්ගේ මුදල් ප්‍රවාහය		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත (ඌනතාව)	(7,531.1)	2,642.7
මුදල් නොවන ගනුදෙනු		
ක්ෂය වෙන්කිරීම	25,840.2	11,092.5
ප්‍රාග්ධන වියදම් කපාහැරීම්	5,420.4	6,480.3
විලම්භිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම්	(26,447.4)	(13,862.4)
පෙර වර්ෂයේ ගැලපීම්	(2,717.9)	(151.1)
ගෙවීම් වැඩිවීම්/අඩුවීම්	2,213.0	(993.0)
අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම	-	232.0
සේවක පිරිවැය සඳහා ප්‍රතිපාදන වල වැඩි වීම	(697.0)	524.0
අනෙකුත් ජංගම වත්කම්වල වැඩි වීම	(1,249.0)	(2,703.0)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)	(2,450.9)	3,262.0
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය		
යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම	(11,340.0)	(30,127.7)
පාරිතෝෂික අරමුදලේ වැඩිවීම	1,611.0	(93.0)
ආයෝජන විකිණීම් වලින් ලැබීම්	48.0	(6480.3)
සංචිත වල වැඩිවීම	(5,420.4)	15.0
ස්ථාවර වත්කම් විකිණීම්	1,128.0	(21,599.0)
ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)	(13,973.4)	(58,285.0)
මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ප්‍රදාන	29,826.2	56,610.0
රජයට විශේෂ අය වීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය (ඇ)	29,826.2	56,610.0
මුදල් හා මූල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ)	13,402.0	1,587.0
ආරම්භක මුදල්/මූල්‍ය ශේෂය.	16,295.0	14,708.0
වර්ෂය අවසානයේ මුදල් / මූල්‍ය ශේෂය	**29,697.0**	**16,295.0**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. } අයිඑස්/ඩී/ජීජේආර්ටීඅයි/1/15/3

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2016 නොවැම්බර් 30 දින

සභාපති,

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 32(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපතිවරයා වෙත 2016 සැප්තැම්බර් 02 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01**

වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන රු. 850,310 ක් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02**

සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානයක් ලෙස භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. 6,390,000 ක් වූ වාහන 02 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වත්කම් අත්පත්කර ගැනීම් සඳහා මුදල් ගලායෑම් ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

2014 වර්ෂයේදී මෝටර් රථයක් ප්‍රත්‍යාගණනය කර තිබුණද ඊට අදාළ පිරිවැය හා සමුච්චිත ක්ෂය ඉවත් නොකිරීම නිසා වත්කම් ගිණුමේ හා සමුච්චිත ක්ෂය ගිණුමේ ශේෂය රු.1,500,000 බැගින් වැඩියෙන් දක්වා තිබුණද එකී වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

ප්‍රත්‍යාගණනය කර තිබූ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂය තුළදී ඉවත් කර තිබූ අතර එකී රථයට අදාළ රු.4,500,000 ක්වූ ප්‍රත්‍යාගණන ලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමෙන් ඉවත් කර රඳවාගත් ලාභයට ගැලපිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්ෂය කලයුතු වත්කම්, වත්කමෙහි ප්‍රයෝජනවත් ආයුකාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කලයුතු නමුත් ක්ෂය ගණනය කිරීමේදී සිදු වූ දෝෂ හේතුවෙන් සමස්ථ ක්ෂය වෙන්කිරීම රු.3,142,066 ක් වැඩියෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

විස්තරය	ක්ෂය ප්‍රමාණය
	රු.
2011-2014 දක්වා ක්ෂය නොකල වත්කම්	(7,795,944)
සමාලෝචිත වර්ෂය - අඩුවෙන් ක්ෂය කිරීම	(4,461,939)
වැඩියෙන් ක්ෂය කිරීම	14,650,330
සම්පූර්ණ ක්ෂය කල වත්කම් තවදුරටත් ක්ෂය කිරීම	749,619
	3,142,066

(ආ) පිරිවැය රු.399,006 ක්වූ පුහුණු පාඨමාලාවලදී භාවිතා කරන මැණික් ගල් තොගය තක්සේරු කිරීමකින් තොරව ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 1999 වර්ෂයේ ප්‍රදානයක් ලෙස ලැබී තිබූ රන් රිදී තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබූ අතර එය අස්ථානගත වීම හේතුවෙන් ගණනය කළ අලාභය වූ රු. 647,782 ක් තොගයෙන් අඩුකිරීම හේතුවෙන් සත්‍ය තොගය ගිණුම්වලින් අනාවරණය වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පාරිභෝජන ද්‍රව්‍ය අවසන් තොගය භෞතිකව ගණනය කර ගිණුම්ගත කිරීම වෙනුවට ඉකුත් වර්ෂයේ අවසන් තොගය වූ රු. 833,428 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් තොගය ලෙස ගිණුම්ගත කර තිබුණු අතර රත්න විද්‍යා අංශයේ තිබූ මැණික් හා අනිකුත් පාරිභෝජන ද්‍රව්‍ය තොග අයිතම 735 ක් ගණනය කර පාරිභෝජන ද්‍රව්‍ය තොගයට ඇතුළත් කර නොතිබුණි. තවද ස්ථාවර වත්කම් ලෙස දැක්විය යුතු පිරිවැය රු. 300,916 ක්වූ පර්යේෂණ උපකරණ හා අබලි තත්ත්වයේ පවතින රු.88,870 ක් වූ ජංගම දුරකථන 03 ක් ද පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය තුළ ඇතුළත් කර තිබුණි.

(ඉ) අවස්ථා 13 කදී බැංකුවට සෘජුව බැර කර තිබූ රු.70,225 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව වර්ෂ 02 ක කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශන වල දක්වා තිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1995 ජූලි 28 දිනැති අංක 882 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 6 ඡේදය	අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයන් පස් දෙනෙකු පත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා සාමාජිකයන් තුන් දෙනෙකු පමණක් පත් කර තිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2004 ජූලි 29 දිනැති අංක PED/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.	මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.3,805,457 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
13(8) වගන්තිය	2014 වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණන වාර්තා පාලක මණ්ඩලය විසින් සලකා බැලීමෙන් පසුව ගැනීමට යෝජිත පියවරයන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,481,616 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,642,900 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 10,124,516 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුද්ගල පඩි නඩි, නඩත්තු වියදම් පිළිවෙලින් රු. 8,263,784 කින් හා රු. 1,924,183 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 හා 2014 වර්ෂවල මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණද 2012, 2013 වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ ඌනතාවයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය, ඉකුත් වර්ෂයන් හා සැසඳීමේදී 2013 වර්ෂයේදී සුළු වශයෙන් පිරිහී තිබුණද අනෙකුත් වර්ෂයන්හිදී ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2014 වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී එය සියයට 26 කින් වැඩි වී රු.49,715,257 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය පාලනය කිරීම, නඟා සිටුවීම සහ සංවර්ධනය කිරීම සඳහා පුහුණු සහ පර්යේෂණ පහසුකම් සැලසීම ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය පිහිටුවා වසර 20 ක් ඉක්මවා තිබුණද එම පරමාර්ථ ඉටුකරගැනීමට සක්‍රිය ලෙස දායක වී නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව මැණික් බනිජ පිළිබඳ සමීක්ෂණයන් හා පර්යේෂණ කිරීම මගින් හඳුනාගත් මැණික් නිධි රටේ ආර්ථික සංවර්ධනයට උකහා දීම වෙනුවෙන් ආයතනයේ දායකත්වය අවම මට්ටමක විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබූ පුහුණු සහ පර්යේෂණ කටයුතුවල කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගාස්තු අයකරන පාඨමාලා 10 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද ඉන් පාඨමාලා 3 ක් පවත්වා නොතිබුණි. තවද මුල් අර්ධ වර්ෂයේදී ශිෂ්‍යයින් 200 ක් නොමිලේ පුහුණු කිරීමට සැලසුම් කර තිබුණද කිසිදු ශිෂ්‍යයෙකු පුහුණු කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන වැඩසටහනට සරිලන පරිදි නව සැලසුමක් යටතේ දෙවන අර්ධ වර්ෂයේ ශිෂ්‍යයින් 190 ක් නොමිලේ පුහුණු කිරීමට සැලසුම් කර ශිෂ්‍යයින් 60 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි.

(ii) මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක මැණික් නිධි ගවේෂණය හා තක්සේරුකිරීමේ ව්‍යාපෘතියට අදාළ ඛනිජ සාම්පල 500 ක් පරීක්ෂා කිරීම සඳහා සැලසුම් කර තිබුණ ද සාම්පල් 245 ක් පමණක් පරීක්ෂා කර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 43 ක අගයක් වී තිබුණි.

(iii) භූගෝල විද්‍යා තොරතුරු තාක්ෂණික හා දුරස්ථ සන්නිවේදන තාක්ෂණික අධ්‍යයන කටයුතු යටතේ සිතියම් 10 ක් නිර්මාණය කිරීම සඳහා සැලසුම් කර තිබුණද සිතියම් 02 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

(iv) තෝරමල්ලි හා කුරුවින්ද මැණික්වල වර්ණය හා පැහැදිලි බව වැඩිදියුණු කිරීමේ තාප පිරියම්/විසරණ ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා පිළිවෙලින් රු.1,000,000 ක් හා 1,500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඊට අදාළ කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වත්කම් මිලදී ගැනීම හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු. 153,789,130 ක් ලැබී තිබුණද රු.127,387,161 ක් පමණක් වැයකර තිබූ අතර රු. 26,401,969 ක් වැය නොකර ඌන උපයෝජිතව පැවතුණි.

4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය ඇස්තමේන්තු කර ඒ අනුව අත්තිකාරම් ලබා නොදීම නිසා වියදමට වඩා සියයට 122 සිට සියයට 467 දක්වා වැඩියෙන් අත්තිකාරම් ලබාදී තිබූ අවස්ථා 8 ක් නිරීක්ෂණය විය.

(ආ) විස්තරාත්මක ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව මැණික් කැපීමේ යන්ත්‍ර 25 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු. 381,400 ක් වැය කර තිබූ අතර සිදුකළ අළුත්වැඩියාවන් සඳහා විස්තරාත්මක බිල්පත්ද ලබාගෙන නොතිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයෙකු විසින් 2007 වර්ෂයේදී සිදු කරන ලද රු. 2,395,749 ක රන් රිදී වංචාවට අදාළව තවදුරටත් අයවිය යුතු රු 1,495,745 ක් සහ එම නිලධාරියා වෙත ගෙවා තිබූ වාහන ණය රු. 56,250 ක් හා ඊට අදාළ පොළියද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2012 ඔක්තෝබර් 25 දින සකස් කර එවා තිබූ ආයතන කාර්යය පටිපාටිය සඳහා වසර දෙකකට ආසන්න කාලයක් ගතවීමෙන් පසු සංශෝධන යවා තිබීම හේතුවෙන් එම සංශෝධන සිදුකිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව ඒ සඳහා ගෙවා තිබූ රු. 317,000 ක අත්තිකාරම් මුදල නිෂ්කාර්ය වියදම් බවට පත් වී තිබුණි.

4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගෙවුඩ තාප පිරියම් කිරීමේ පර්යේෂණ කටයුතු සඳහා රු. 10,977,344 ක් වැයකර 2013 වර්ෂයේදී මිලදීගෙන තිබූ අධි උෂ්ණත්ව විදුලි උදුන 2016 වර්ෂයේ ජූනි වන විටත් කිසිදු කටයුත්තකට යොදාගෙන නොතිබුණි. යන්ත්‍රයේ වගකීම් කාලය ඉකුත් වී තිබූ අතර යන්ත්‍රය පරීක්ෂාවෙන් පසුව එය අදාළ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි බවද නිරීක්ෂණය විය.

(ආ) 2007 වර්ෂයේදී රු.12,309,013 ක පිරිවැයක් දරා භූ විදුම් යන්ත්‍රයක් මිලදීගෙන සමාලෝචිත වර්ෂය දක්වා රක්ෂණය කිරීම වෙනුවෙන් රු.910,725 ක් වැයකර තිබුණද 2016 ඔක්තෝබර් 31 දින වනවිටත් එම යන්ත්‍රය ඵලදායීව උපයෝජනය කර නොතිබුණි.

(ඇ) රත්නපුර මධ්‍යස්ථානයේ කුලී ගොඩනැගිල්ල ඵලදායීව භාවිතා කර නොතිබූ අතර එහි බිම් මහල හා දෙවන මහලෙහිද වැඩි ප්‍රමාණයක් භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

4.6 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සහකාර තනතුරු සඳහා බඳවාගැනීමේ පරිපාටියට පටහැනි ලෙස එම සේවයේ II ශ්‍රේණිය සඳහා 2010 වර්ෂයේදී බඳවාගත් නිළධාරිනියක් සඳහා සේවා ස්ථිර කිරීමකින් තොරව හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වීමකින් තොරව වැටුප් වර්ධක ලෙස රු. 78,720 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නියමිත වැටුප් පියවරට වඩා ඉහළ වැටුප් පියවරක පිහිටුවීම හේතුවෙන් 2009 මැයි සිට 2015 ජූලි දක්වා නිලධාරියෙකු වෙත රු. 619,646 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීම

2003 ජූනි 2 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6. 5. 1 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 78 ක් ප්‍රමාද වී 2016 මැයි 17 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා ලබා දී තිබූ රු. 22,170,000 කට අදාළව ක්‍රමවත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 2 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය පරීක්ෂාකිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන කාර්යය සඳහා ආයතනයේ සභාපතිවරයාට වගකියන විගණකවරයෙකු පත් කර ඇතත් ඔහුට සහාය වීම සඳහා ස්ථිර විගණන කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණකගේ විගණනය පිළිබඳ වෘත්තිය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන වැඩසටහන මගින් සැලසුම් කර සම්පත් වෙන් කරන ලද පර්යේෂණ කටයුතු, බඳවාගැනීම් සහ ගබඩා කටයුතුවලට අදාළ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී නිවැරදි පරීක්ෂාවට භාජනය කරන ලද අයිතම අටක සියයට 16 සිට සියයට 213 ක පරාශයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	(i)	ගිණුම්කරණ සංකල්ප හා ප්‍රමිති අනුව ගිණුම් සකස් කර නොතිබීම.
	(ii)	ජනල් සටහන් ගණකාධිකාරී විසින් සහතික කර නොතිබීම.
	(iii)	ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් නිවැරදි ක්ෂය ගණනය නොකිරීම.
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය	(i)	නිළධාරීන්ගේ පැමිණීම, පිටවීම හා නිවාඩු සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල වීම.
	(ii)	අනුමැතියකින් තොරව නිළධාරීන් බඳවාගැනීම.
	(iii)	ඇතැම් නිළධාරීන්ට වැඩිපුර ගෙවා තිබූ වැටුප් අයකිරීමට කටයුතු කර නොතිබීම.
(ඇ) ප්‍රසම්පාදනය		ප්‍රසම්පාදන සැලැස්මක් සහිතව අවශ්‍යතා අනුව කාලීනව මිලදීගැනීම් සිදුකර නොතිබීම.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති